# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 ජූලි මස 07 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017. 07. 10 දින නිකුත් කරන ලදී)

# පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන)

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නාම යෝජනා පත්‍රයක ඇතුළත් කළ යුතු කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව නිශ්චිතව දැක්වීමය.

*3 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නාම යෝජනා පත්‍රයක ඇතුළත් කරනු ලබන මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට තිහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන් ඇතුළත් කිරීමය.

*4 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නම් කළ යුතු නියමිත කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව ඇතුළත් නොවන යම් නාම යෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමය.

## පළාත් සභා ඡන්ද විමසීම්
## (සංශෝධන)

එල්. ඩී. — ඕ. 30/2015.

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක      දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1988 අංක 2 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "13(1) වන වගන්තිය යටතේ නාම යෝජනා පත්‍රයෙහි දැක්වීමට නියමිත අපේක්ෂක සංඛ්‍යාව," යන වචන වෙනුවට "13(1) වන වගන්තිය යටතේ නාම යෝජනා පත්‍රයෙහි දැක්වීමට නියමිත අපේක්ෂක සංඛ්‍යාව සහ 13(1අ) වන වගන්තිය යටතේ නාම යෝජනා පත්‍රයෙහි දැක්වීමට නියමිත කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව," යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1අ) මේ පනතේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන එක් එක් නාම යෝජනා පත්‍රයේ සඳහන් මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට තිහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන්ගෙන් සමන්විත විය යුතු ය.

(1ආ) අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් සියයට තිහක් වන නම් කළ යුතු කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව, සම්පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන අවස්ථාවක දී මේ වගන්තියේ කාර්ය සඳහා සම්පූර්ණ සංඛ්‍යාව සහ භාගයකට ආසන්නතම සම්පූර්ණ සංඛ්‍යාව සියයට තිහක් වන බවට සලකනු ලැබිය යුතු ය.".

2—PL 005249 -475 (2017/06)

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "නියමිත අපේක්ෂකයන් මුළු සංඛ්‍යාව" යන වචන වෙනුවට "නියමිත කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව ඇතුළු අපේක්ෂකයන් මුළු සංඛ්‍යාව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.